# සොරත නාහිමි සිරිත

ශාස්ත්‍රාචාර්ය

## ගණේගම සරණංකර හිමියන් විසිනි

1963

සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිතයි.

# සොරත නාහිමි සිරිත

ලක් බුදු සසුන ඒකාලෝක කළ පහන නිවී ගියේ ය. ලක් සසුනඹරේ දිළිසි දිළිසී තිබුන පහන් තරුව නිවී ගියේ ය. ලකගනගේ ගෙල පැළඳි රුවන් දමෙහි අගමිණි රුවන අතුරු දහන් විය. ලක්දිව පඬිවරුන්ගේ අනූපම අද්විතීය පඬිවරයා නොපෙණී ගියේ ය. ලක්දිව මහා සංඝයා වහන්සේගේ නිල නොලත් සංඝරාජ වරයා අපවත් විය. සිංහල ගත් කරුවන් අතර ශ්‍රෙෂ්ඨතම ගත්කරුවා අභාවයට ගියේ ය. ලෝකයේ විශ්වවිද්‍යාලාධිපතීන් අතර මුලු ජීවිතයම විශ්ව විද්‍යාලයට කැප කළ එකම උපකුලපතිවරයා නැතිවී ගියේ ය. විද්‍යොදය විශ්වවිද්‍යාලාධිපති සාහිත්‍යසූරි සාහිත්‍ය චක්‍රවර්ති පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ සොරතාභිධාන නායක මාහිමියානන් වහන්සේ අපවත් වූ සේක. අහෝ ඛෙදයකි!

### ජන්ම ලාභය

ලක්දිව බුදුසස්නට පැවිදි පඬිවරුන් නැමති මිණිරුවන් ලබා දෙන රත්නාකරයක් බඳු ගාලු පළාතේ ගිංගඟ අසබඩ වැලිවිටිය නැමැති ග්‍රාමවරයෙහි ඇති උසස් පවුල් අතර කුමාරසිරි ජයවර්ධන පවුල ප්‍රධාන තැනක් ගණියි. කෝට්ටේ රාජධානිය කොට විසූ හවෙනි පරාක්‍රමබාහු රජුගේ සමයෙහි තොටගමු විහාරයේ බස්නායක ධුරය දරුවේ මේ කුමාරසිරි ජයවර්ධන පරපුරේ ආදිම මුත්තනුවෝය. මේ පරපුරට අයත් දොන් ජොහානිස් කුමාරසිරි ජයවර්ධන වෛද්‍යාචාර්‍ය වරයා හික්කඩුවේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ගෘහස්ථ ශිෂ්‍යවරයෙකි. මොහු සුදුසු වයස පැමිණි කල්හි ගාල්ලේ උනවටුනේ මල්වත්ත වලව්වට අයත් ඇලිස් අමරසිංහ හාමිනේ සමඟ පැරණි සිංහල චාරිත්‍රානුකූලව සුභ සරණ බන්ධනයට ඇතුලත් විය. අප කථානායක වරයාගේ මවු පියෝ මේ දෙපොලය. මොවුන් ට ලැබුනු දරුවන් සදෙනාගෙන් මුල් තිදෙනා කුඩා කල කාලක්‍රියා කළ අතර පුතුන් දෙදෙනෙක් හා දුවක් ද ජීවත් වූහ. පුතුන් දෙදෙනාගෙන් වැඩිමහල් පුතා චන්ද්‍රදාස කුමාරසිරි ජයවර්ධනය. මොහු උපන්නේ 1897 මැයි මස 23 වෙනි ඉරුදින මෑනියන්ගේ ගම වූ කෝදාගොඩදීය. චන්ද්‍රදාස ස්වකීය මුත්තනුවන් වූ කොදාගොඩ අල්විස් දියෙස් සමරවික්‍රම මහ රෙජිස්ට්‍රාර් රාලහාමි ලඟ නතරව එතුමාගේ බෑනනුවන් වූ ප්‍රැන්සිස් වික්‍රමරත්න ගුණසේකර නොතාරිස් රාළහාමි සිංහල ගුරුවරයෙකු වශයෙන් හීනටියන පාසැලේ උගන්වද්දී එතුමාගෙන් මූලික අධ්‍යාපනය ලැබුවේය. මේ අතර ඒ අසල පිහිටි රන්වලගොඩ විද්‍යාවර්ධන පිරිවෙණෙහි ද ඉගෙණ ගත්තේ ය. මොහු සමඟ එහි උගත් ශිෂ්‍යයන්ගෙන් එක්කෙනෙකි පසු කලක පුරාවිද්‍යා කොමසාරිස්වර සෙනරත් පරණවිතාන මහතා.

### පැවිදිවීම

චන්ද්‍රදාසට වැඩිමහල් සහෝදරයන් තිදෙනෙකු කුඩාකල මිය ගිය බැවින් පසළොස් හැවිරිදි ඔහු මහණ කරණු කැමති කුමාරදාස වෙද මහතා තමාත් සමඟ විද්‍යොදය පිරිවෙණේ එකට ඉගෙණගත් තම මිත්‍ර හික්කඩුවේ තිලකාරාමාධිපති කහවේ පෙමරතන මහා ස්ථවිරපාදයානන් වහන්සේ ට බාර කළේ ය. උන් වහන්සේ 1912.10.15 වෙනි දිනට යෙදුනු සුභ නැකතින් මහණ කොට **"වැලිවිටියේ සොරත"** යියි කුඩා හෙරණ පානන්ට නම් කළහ. කුඩා කල සිට ඉගෙණීමෙහි අතිශයින් දක්ෂකම් දක්වූ සොරත සාමණේර නම කටපාඩම් කිරීමට දුන් හැම පොතක් ම බොහෝ ඉක්මනින් කටපාඩම් කළේ ය. ධම්මපදයේ ගාථා 423, දින කීපයක් තුළදී කටපාඩම් කළේ ය. මේ දිනවල මහින්ද විද්‍යාලයේ දී ධම්මපද විභාගයක් පැවැත්විනි. ඒ සඳහා පළාතේ සාමණෙරවරු තිහ හතළිහක් පමණ ඉදිරිපත් වූහ. සොරත සාමණේරයන් වහන්සේ ද ඉදිරිපත් වී එහි ප්‍රමුඛයාට නියමිත ත්‍යාගය දිනා ගත්හ. සොරත යන නාමය පළාතේ භික්ෂූන් වහන්සේලා අතර හාපුරා කියා පැතිර ගියේ මේ ධම්මපද කටපාඩම් විභාගයේ දී ජයග්‍රහණයෙන් ය. සහජයෙන් ඉගෙණීම ප්‍රිය කළ සොරත සාමණෙරයෝ ස්වකීය ගුරු හාමුදුරුවන් ගෙන් අර්ථ අස්වාගෙණ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට නියමිත පොත් උගෙණ එම විභාගයට පෙනී සිට ලංකාවේම ප්‍රධානියා ලෙස පන්සලේදීම (පිරිවෙනක් ඇසුරු නොකොට ම) සමර්ථ වූහ.

### උපසම්පදාවීම

1917 වන විට උපසම්පදාවීමට සුදුසු වයස පැමිණියෙන් මහනුවර මල්වතු විහාරයේ උපොසථසීමා මාලකයේ දී තම උගත් කම පිළිබඳ දක්ෂකමෙන් මහනුවර සංඝ සභාව මවිත කරවමින් උපසම්පදාව ලැබූ සොරත තරුණ භික්ෂුවරයාට, විද්‍යොදය පරිවෙණාධිපතිව වැඩවිසූ මහගොඩ ශ්‍රී ඥානේශ්වර නායක මාහිමිපානන් වහන්සේත් කහවේ ශ්‍රී පේමරතන, හික්කඩුවේ ශ්‍රී පෙමානන්ද යන මහා ස්ථවිරයන් වහන්සේලා දෙනමත් ආචාර්‍යවරයෝ වූහ.

## විද්‍යෝදය පිරිවෙණට පැමිණීම

උපසම්පදා වූ වර්‍ෂයේ ම (1971දී) විද්‍යෝදය පිරිවෙණට ඇතුල් වූ සොරත හිමියෝ අවසාන වර්ගයේ ඉගෙණීම කරද්දී ම (1922) එකල විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩ විසූ කහවේ ශ්‍රී රත්නසාර නායක මාහිමියන් විසින් ආචාර්‍ය්‍ය පදවියකට ද පත් කරණ ලදහ. 1923 දී හෙවත් ආචාර්‍ය්‍යපදවියට පත් වූ වර්‍ෂයේ ම ප්‍රාචීන අවසාන විභාගයෙන් ඉතා උසස් ලෙස සමර්ථව ස්වර්ණ මුද්‍රිකාව ද දිනාගත් සොරත හාමුදුරුවන් වහන්සේගේ උගත්කම පිළිබඳ රාවය විද්‍යෝදය ශිෂ්‍යයන් අතර වාතවේගයෙන් මෙන් පැතිර ගියේ ය. කහවේ නාහිමියන්ගේ ඇවෑමෙන් විද්‍යෝදය පරිවෙණාධිපති පදවියට පත් වූ බද්දේගම ශ්‍රී පියරතන නාහිමියන්ගේ කාලයෙහි (1936 දී) පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ සෝරත ස්වාමිපාදයෝ විද්‍යෝදය පිරිවෙණේ උප ප්‍රධාන ධූරයට පත් වූහ. ඉන් ටික කලකට පසු ලංකාණ්ඩුවේ ශිෂ්‍යත්වයක් ලැබ ඉන්දියාවට ගොස් කල්කටා විශ්ව විද්‍යාලයේ වර්‍ෂ කීපයක් ශාස්ත්‍රීය පර්‍ය්‍යේෂණයක යෙදී සිට පෙරලා ලංකාවට වැඩියහ.

## ත්‍රිපිටක පරිවර්තනයේ ප්‍රධාන කතෘ ධූරය

2500 බුද්ධ ජයන්ති මහෝත්සවය වෙනුවෙන් රජය විසින් නියම කරගත් ත්‍රිපිටක පෙළත් සමග සිංහලට නැගීම පිළිබඳ මණ්ඩලයේ සභාපති හැටියටත්, එම ග්‍රන්ථ මාලාවේ ප්‍රධාන කතෘවරයා හැටියටත් සොරත නාහිමියන් වහන්සේ පත්කර ගනු ලැබූහ. 1954 සිට අපවත් වන කල් දක්වාම උන්වහන්සේ මෙම කාර්‍ය්‍යයෙහි නියුක්ත ව සිටි සේක.

## සංඝ නායක ධූරයට පත්වීම

කුශාග්‍ර බුද්ධිමත් පඬිවරයෙකු වශයෙන් හා ජනප්‍රියා ආචාර්‍ය්‍යවරයෙකු වශයෙන් ලැබූ කීර්තිය විසින් පොලඹවන ලද මහනුවර මල්වත්තේ සංඝ සභාව විද්‍යෝදය පිරිවෙණේ උප ප්‍රධානාචාර්‍ය්‍ය පණ්ඩිත වැලිවිටියේ සොරත ස්වාමීන්ද්‍රයන් වහන්සේ ට ගාලු කෝරලයේ ප්‍රධාන සංඝ නායක පදවිය පිරිනැමීමෙන් සිය ප්‍රසාදය පළකළාහ. අභිනව නායක පදවියට පත්වීමෙන් ශ්‍රී සොරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සියම් නිකායේ මහා සංඝ සභාවට ගෞරවයක් වූහ. නායක කම ලැබීම පිළිබඳ කිසිම උත්සවයක්, කිසිම විශෙෂයක් නො දක්වූ අප දන්නා එකම භික්ෂූන් වහන්සේ සොරත නාහිමියන් වහන්සේ ය.

## පරිවෙණාධිපති ධූරය

බද්දේගම පියරතන නායක මාහිමියානන් වහන්සේ අසනීපයෙන් විසූ කාලයේදී සම පරිවෙණාධිපති ධූරය දරා උන්වහන්සේගේ ඇවෑමෙන් හිස් වූ විද්‍යෝදය පරිවෙණාධිපති පදවියට පත් කරණු ලැබූ සොරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මහා පාණ්ඩිත්‍යයටත්, කුශාග්‍ර බුද්ධියටත් ලියූ පොත් වලටත් අනුපම භාග්‍යයටත් පරණ තාප්පයකින් වටවූ අක්කර පහකට සීමා වූ විද්‍යෝදය පිරිවෙණ ප්‍රමාණවත් නොවීය. මෙරට ලැබූ නිදහසත්, එකල පැවති ආණ්ඩුවත්, සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වීමත්, පොදු ජන ප්‍රබෝධයත් වැනි බල වේග කීපයක් සොරත නාහිමියන් වහන්සේගේ භාග්‍යයට ආවඩන්නට විය. කාලය විසින් මවන ලද නොයෙකුත් අවශ්‍යතාවෝ සොරත නායක හාමුදුරුවන්ගේ දක්ෂතාවටත් භාග්‍යයටත් විද්‍යෝදය පරිවෙණාධිපතිකම ප්‍රමාණවත් නොවන බව කියන්නට වූහ.

## විශ්ව විද්‍යාලාධිපති ධූරය

1956 යෙන් උදා වූ බණ්ඩාරනායක ආණ්ඩුව සිංහල රාජ්‍ය භාෂාව කොට එය ක්‍රියාවේ යොදවනු සඳහා මේ රටේ සිංහල සාහිත්‍යයට සේවයක් සිදුකළ පැරණි, ජාතික ආයතන දෙකක් වූ විද්‍යෝදය පිරිවෙණ හා විද්‍යාලංකාර පිරිවෙණත් විශ්වවිද්‍යාලය තත්ත්වයට පත් කළේ ය. සොරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ අධිපති පදවියට අග්‍රාණ්ඩුකාරතුමා විසින් පත් කරණ ලදහ. සුදුස්සාට සුදුසු තනතුර ලැබුනේ ය. දක්ෂකම ක්‍රියාවේ යොදන්නට අවස්ථාව ලැබුනේ ය. ලහි ලහියේ වැඩ ආරම්භ විය. පණ්ඩිත පලන්නරුවේ විමලධම්ම නායක හාමුදුරුවන් වහන්සේ හා ආචාර්‍ය්‍ය ආනන්ද ගුරුගේ මහතා වැනි අති දක්ෂ සහායකයන් දෙදෙනෙකුගේ උදව් ලැබුනේ ය. වර්‍ෂ දෙක තුනකට සීමාවූ ස්වල්ප කාලයක් තුළ අගනුවර අසල ගංගොඩවිල දර්ශනීය විශාල භූමි භාගයක දෙතුන් මහල් මහා ප්‍රාසාද මැවුනේය. ඇසූ දුටුවන් මවිත කරමින් ළදරු විශ්වවිද්‍යාලය අවුරුදු සතරක් තුළ තරුණ විශ්වවිද්‍යාලයක් බවට පත් විය. අතිදක්ෂ විශ්වවිද්‍යාලාධිපති වරයෙකුගෙන් හා දක්ෂ මහාචාර්‍ය්‍ය

කථිකාචාර්යවරයන්ගෙන්ද එඩිතර ලේඛකාධිකාරිවරයෙකුගෙන් හා ප්‍රගතිශීලී ගිහිපැවිදි ශිෂ්‍යයන්ගෙන් ද යුත් විද්‍යෝදය විශ්වවිද්‍යාලය අවුරුදු විස්සක පලපුරුදු කම් තලතුනාකම් කියාපායි. මේ සියල්ලෙහිම නිර්මාතෘවරයා සොරත නායක මාහිමියන් වහන්සේ ය.

## ගතිගුණ

නොඋස්නොමිටි ශක්තිමත් නිරෝග සිරුරක් ඇති සෝරත නායක මාහිමියන්ගේ තරුණ කාලයෙහි මුහුණෙහි ශාන්ත භාවය තුළින් ආඩම්බර බවත් ප්‍රතාපවත් භාවය හා නිර්භීත භාවයත් දිස්විය. නිතරම රැඳි බුලත් විටින් මුව සැරසී ඇත. ඇස් දෙක වට කුරුය. ගැඹුරු දේ දක්නා තරම් තියුණුය. පුලුල් නලල් තලයෙන් යුත් හිස බුද්ධියෙන් පිරී ඇති බව පෙන්වයි. ගැඹුරු කටහඬ අධිපති භාවය පෙන්වයි. කථාව අවංකය, කෙටිය. වර්ණනා අතිශයෝක්ති විරහිතය. ගමන හෙමින් ය. බරය. තාලෙටය.

සොරත නායක හාමුදුරුවන් වහන්සේ දක්ෂ ලේඛකයෙකි. අදක්ෂ කථිකයෙකි. ප්‍රසිද්ධ සභාවලදී කරණ කථා ජනප්‍රියත්වයෙන් තොරය. කථා කළ යුත්තේ පිරිස සතුටු කිරීමටයයි උන් වහන්සේ කිසි විටෙකත් නොසිතූහ. උන් වහන්සේට ඕනෑ කළේ හෘදය සාක්ෂියට අනුව සත්‍යය පමණක් කථා කිරීමයි. එබැවින් ඒ කථා අවංක භාවයෙන් හා සත්‍ය යෙන් පිරී ඇත. එහෙත් ඇතැම් විට ප්‍රසිද්ධ පුවත් පත් වලින් පවා විවේචනයට ලක්විය. දේශපාලනඥයෝත් පූජකයෝත් ගුරුවරුත් කුහකකමින් යුක්තයයි ප්‍රසිද්ධය. එහෙත් සෝරත නායක හාමුදුරුවෝ කුහකකම කුමක්දැයි නොදනිති. මිනිසුන් අනික් මිනිසුන් මනින්නේ ඒ ඒ දෘෂ්ටිකොනයනගෙනි. සෝරත නාහිමියන්ගේ ගතිගුණ හා අදහස් උදහස් කෙරෙහි නොයෙක් දෙනා නොයෙක් නොයෙක් දෘෂ්ටි නෝනවලින් මැන ඇතැම් විට උන් වහන්සේ ගැන වැරදි අවබෝධ ඇති කර ගෙන සිටිති. කුහක කමක් නැති බැවින් උන් වහන්සේ තුළ පිහිටි ශ්‍රේෂ්ඨ ගතිගුණ බොහෝමයක් වැසී තිබුනේ ය. උන් වහන්සේ නිහතමානිය. යුක්ති ගරුකය. කාරුණිකය. තත්ත්වයෙන් උසස් වෙන්නට වෙන්නට අනුකම්පා සහගතවූහ. චරිතය අතිශයින් පරිසිදුය, අහිංසකය, සිල්වත්ය. ජීවිතයෙන් වැටි කාලයක් ගත කළේත්, ආශ්‍රය කළේත් ධර්මශාස්ත්‍රීය පොත්පත් සමගය. උන් වහ්නසේ නියම යතිවරයෙකි. සැබෑ මහාත්මයෙකි. මහාත්මකම උන්වහන්සේගේ යටිපතුලේ සිට හිස දක්වාම තිබුණි.

ක්‍රියා කලාපය අතිශයින් ම සරලය. සැහැල්ලුය. වළඳන්නට ගොස් ලුණු නැත, ඇඹුල් නැත, රස නැතැයි කිසි දිනෙක නොකීහ. තමන් වළඳන හැම දෙයක් ම තමන් ලඟ සිටින හැම දෙනාටම අසල්වැසි හිතවත් හැම දෙනාටම බෙදාදී වළඳන්නට පුරුදුව සිටියහ. වටිනා සිවුරු පොරවන්නට වැඩි කැමැත්තක් නැත. තමන් හමුවන්නට එන අය අතර හොඳම හිතවතාට කළ ලොකු සැලකිල්ලක් නම් හකුරුත් සමග තේ දීමයි. තනියම කිසි දිනක මොටෝරියෙන් නොගියහ. කවුරුන් හෝ අඳුනන් කෙනෙකු හමුවුවහොත් මගදී හරි නංවා ගණිති. උන්වහන්සේගෙන් ඕනෑම දෙයක් ඉල්වා ගතහැකි ඕනෑම දෙයක් කරවා ගත හැකි හොඳම වේලාව දවාලට වළඳා සැතපෙන්නට යන වේලාව අතර කාලයයි.

## ජනප්‍රියා ආචාර්යවරයා

සෝරත නායක හාමුදුරුවෝ උගැන්වීමට අතිදක්ෂය. එක කරුණක් පහදා දෙනු සඳහා නොයෙක් පොත පතින් උදාහරණ ගෙන දක්වති. අසවල් වචනය තිබෙන්නේ අසවල් පොතේ අසවල් පිටුවේයයි කීමට තරම් පොත්වල පිටු අංක පවා මතකය. සිංහල, පාලි, සංස්කෘත හා ප්‍රාකෘත භාෂා වලින් ලියවී ඇති පැරණි හැම පොතක්ම කියවා ඇත. ඉංග්‍රීසි නවකථා පමණක් හත්සියයක් කියවා ඇත. විද්‍යෝදය පිරිවෙණේ උගත් ශිෂ්‍යයෙකු තම උගත් කමින් සෑහීමට පත් වන්නේ සෝරත නායක හාමුදුරුවන්ගෙන් එක අවුරුද්දක්වත් ඉගෙනගතහොත් පමණකි. හැම ශිෂ්‍යයෙක් ම තම ශ්‍රේෂ්ඨ ආචාර්යවරයා ගැන ආඩම්බර වෙති. වර්ෂ තිස් පහක් පමණ වූ ජීවිත කාලය තුළ උන් වහන්සේගෙන් උගත් ගිහි පැවිදි ශිෂ්‍යයෝ දහස් ගණනක් ලක්දිව හැම පැත්තකම පාහේ උසස් තැන් ලබා සිටිති. පැරණි අධ්‍යාපනයෙන් වැඩුනු උන් වහන්සේ නවීන අධ්‍යාපනඥයකුට අවශ්‍ය සකලාංගයන් ගෙන් සම්පූර්ණයහ.

## බහුශ්‍රැත පඬිවරයා

සායන පාණිනීත් බුද්ධඝෝෂ මාහිමි හා ගුරුළු ගෝමීන් සෝරත නායක මාහිමියන් තුළ එකවරම දක්ක හැකි වෙති. දහහතරවෙනි සතවර්ෂයේ විසූ තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමිත් දහනවවෙනි ශතවර්ෂයේ විසූ හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමිත් විසි වෙනි ශතවර්ෂයේ විසූ වැලිවිටියේ ශ්‍රී සෝරත නායක මාහිමිත්

එක් නොකම තුන්වරක් ඉපදීමෙන් පහළ වූ පුනරාවතාරයක් ලෙස මට හැඟේ. දිඹුලාගල මහා කාශ්‍යප, ධර්මකීර්ති, වනරතන, ශ්‍රී රාහුල, ශ්‍රී සුමංගලාදී, පැරණි සිංහල පැවිදි පඬි පරපුරේ අන්තිම පුරුක සෝරත නාහිමියන් ලෙස මට සිතේ. උන් වහන්සේ ජීවමාන ජංගම පුස්තකාලයකි.

**ලියූ පොත්වලින් කීපයක්**

1. ප්‍රාකෘත සූක්ති මඤ්ජරී.
2. සිංහල දශ කුමාර චරිතය.
3. වෘත්තරත්නාකර සරලාව්‍යාඛ්‍යා.
4. දහම් සොඬකාව්‍ය (පරිකථාව).
5. මයුර සන්‍දෙශ විස්තර වර්ණනාව.
6. බුත්සරණ ගැටපද විවරණය. 1, 3 කාණ්ඩ.
7. පරෙවි සංදේශ පරිකථාව.
8. එලුසඳැස් ලකුණු සඤ්ජීවනී ව්‍යාඛ්‍යා.
9. කව්සිළුමිණි කල්පලතා ව්‍යාඛ්‍යා.
10. සෞන්දරනන්ද කාව්‍ය කල්පලතා ව්‍යාඛ්‍යාව.
11. අමාවතුර ගැටපද විවරණය.
12. කථාතරංගිණී.
13. කථාමෘතය.
14. පාසැල් දවස.
15. සාහිත්‍යසේවනය.
16. හිරාසන්‍දෙශ විස්තර වර්ණනාව.
17. හංසසන්‍දෙශ විස්තර වර්ණනාව.
18. සද්ධර්මරත්නාකර ගැටපද විවරණය (කාණ්ඩයක්).
19. පූජාවලී ගැටපද විවරණය (කාණ්ඩයක්).
20. කුශජාතක කාව්‍ය සංග්‍රහය.
21. කාව්‍යශේඛර ගැටපද විවරණය.
22. දළදා පහන (දළදා සිරිතෙහි පරිකථාව).
23. සංස්කෘතශබ්දාර්ණවය.
24. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය.

**ලියූ ශාස්ත්‍රීය ලිපිවලින් කීපයක්**

නිරුක්තිවිධි ... ... ආනන්දෝදය ... 1921 සැප්තැම්බර් 15-කාණ්ඩ 1

කුමක් සැපද ... ... එම ... 1922 මැයි 10

ස්වස්ථතා සංස්කරණය ... එම ... 1922 අගෝස්තු-කාණ්ඩ 2

අපේ භාෂාව ... ... එම ... 1923 ජනවාරි-කාණ්ඩ 5

පෘථුවිගර්භය ... ... එම ... 1923 ඔක්තෝබර්

මහත්ශබ්දය ... ... එම ... 1924 අප්‍රේල්

මුවදෙව්දා විවරණය ... ශ්‍රී ධර්ම ශ්‍රී ... 1923 අගෝස්තු

එම ... එම ... 1923 ඔක්තෝබර්

එම ... එම ... 2923 දෙසැම්බර්

නිරුක්ති පටිසම්භිදා ... එම ... 1924 අප්‍රේල්-මැයි

සිංහලකාරකලක්ෂණ ... විද්‍යොදය 1-4 ... (1926) ජනවාරි-අප්‍රේල්

දෙවැනි පැරකුම්බා රජුගේ ගද්‍යකෘතිය ... 1936

පෙර ලක්වැසියා හා විදුලි බලය ... 1938

පාවචනද ප්‍රාවචන ද? ... ප්‍රාචීන භාෂොපකාර සමාගමේ වාර්ෂික සංග්‍රහය, 1943

පාලි පොත්හි වැරදි තිබෙන තැන් කීපයක් ... 1944

සෞන්දරනන්ද කාව්‍ය ... විද්‍යොදය ... 1945

බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ ... එම ... 1945

කව්සිළුමිණ ... ... 1946

**සේවයට කැප කළ ජීවිතයක්**

සෝරත නායක හාමුදුරුවන්ගේ මුළු ජීවිතයම පරාර්ථය සඳහා කැපවී ඇත. මහණ වූ දින සිට අපවත් වූ දින තෙක් උන් වහන්සේ ගේ කාලය, ශක්තිය, ඥානය හා ධනය සම්පූර්ණයෙන් ම යෙදුනේ ස්වකීය රට, ජාතිය, ආගම හා භාෂා සාහිත්‍ය සඳහාය. නිදිමරා දුක්විඳ ඉගෙන ගත්හ. උන් වහන්සේගේ ආයුෂයෙන් වැඩි හරියක් පොත් ඉගෙණීම, උගැන්වීම, පොත් බැලීම, පොත් ලිවීම සඳහා ගතවී ඇත. කෑම් බීම් ඉඳුම් හිටුම් ආදී කිසිම ඉරියව්වකදී සුව පහසුව ගැන නොතැකූහ. විද්‍යොදය පිරිවෙණෙහි ඇති කුඩා කාමර දෙකකින් හා ඉස්තෝප්පුවකින් යුත් පැරණි කුටිය තුළ වූ අසුනක වාඩිවී එක් පසෙකින් බුලත් හෙප්පුවක් ද අනෙක් පසින් පඩික්කමක් ද ඇතුව පොත් බලමින් හෝ ලියමින් සිටිනු නිතර දක්නට ලැබුනි. එහි තිබෙන පොත් අල්මාරි කීපයෙහිම අවශ්‍ය අගනා සෑම පොතක් ම විය. ලක්දිව ටිකක් කථා කොට හුගක් වැඩ කළ ගිහි පැවිදි උතුමන් අතර සෝරත නායක හාමුදුරුවන් ද එක්කෙනෙකි. බුදුන් වහන්සේ භික්ෂූන් සඳහා නියම කළ "ධම්මීවාකථා අරියො වා තුණ්හීභාවො" (කථා කරතොත් ධාර්මික කථාවක් ම කළයුතුය නැතිනම් ආර්‍යයා නිශ්ශබ්ද බව විය යුතුය.) යන්න සෝරත නායක මාහිමියෝ අකුරටම පිළිපැද්දාහ. වයස්ගත වූවායින් පසුවත් සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන්නට ඕනෑ යයි නිකමටවත් නොසිතූ උන් වහන්සේ තමන් සඳහා ගංගොඩවිල විශ්වවිද්‍යාලය භූමියේ තනවා ඇති අලංකාර මන්දිරයෙහි වාසය කිරීම ප්‍රතික්ෂෙප කොට එය සම්භාවනීය අමුත්තන් සඳහා යෙදවීමට තීරණය කරගත්හ. විශ්වවිද්‍යාලයාධිපතිවරයා වශයෙන් තමන් වහන්සේට ලැබුන මුදලින් සුළු ගණනක් ගෙන වැඩි කොටසක් (රු.50,000කට වැඩි) විශ්ව විද්‍යාලයට පරිත්‍යාග කළහ. විද්‍යොදය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය තව නොබෝ කලකින් මුළු ආසියාවේම ඇති අංග සම්පූර්ණ විශාල පුස්තකාලය වනු ඇත. ඒ සඳහා උන් වහන්සේ නොගත් උත්සාහයක් නැත. පැරණි ලියකියවිලි භාර දෙපාර්තමේන්තුව සඳහා පුස්තකාලයෙන් කොටසක් දීමට කැමති වූහ. පුස්තකාලයෙහි එක්

කෞතුක වස්තු සපයා ගනු සඳහා උන් වහන්සේ ගාලු, මාතර, උඩරට, කුරුණෑගල ආදී නොයෙක් පළාත්වල පුරාණ විහාරස්ථාන වලට ගොස් ඉල්ලා ගෙන වුත් තැන්පත් කොට ඇති කෞතුක වස්තු බොහෝය. පුරාණ කාසි වර්ග රාශියක් ලබාගෙන ඇත. විශ්ව විද්‍යාලයාධිපති වීමෙන් පසු උන් වහන්සේ උගැන්වීම හා පොත් ලිවීම නතර කොට විශ්වවිද්‍යාලයෙහි ගොඩනැගිලි තැනවීම සඳහා කාලයත්, ශක්තියත්, බුද්ධියත් යෙදවූහ. එක් අතකින් පමණක් නොව නොයෙක් අතින් දක්ෂයෙක් වූ නායක මාහිමියෝ ගෘහ නිර්මාණ ශිල්පීන්ටද උපදෙස් දුන්හ. ඇතැම් විට ගොඩනැගිලි වල ඇතැම් තැන් කඩවා වෙනස් කරවූහ. විශ්වවිද්‍යාලය භූමියට අහසින් වැටෙන වතුර පවා අපතේ නොයන ලෙස විශාල වළක් කනවා ඒවා එහි රැඳෙන හැටියට සැලැස්වූහ. බණ්ඩාරවෙල නුවරඑලිය වැනි ප්‍රදේශවලට වැඩිය හැම ගමනකදීම නොයෙක් මල් ඇට පැලජාති ගෙනවුත් මල් වවන්නාට දුන්හ. විශ්වවිද්‍යාල භූමිය මැද අලංකාර පුෂ්පෝද්‍යානයක් තනවා ඇත. පොල් පැල තැඹිලි පැල ඒ ඒ සුදුසු තැන්හි සේවකයන් ලවා හිටුවීම වැනි සුළු වැඩෙහි පවා යෙදුනාහ.

ශිෂ්‍යයෝත් ආචාර්ය වරුත්, නිලධාරීහුත්, සේවකයෝත් හැම පැමිණිල්ලක්ම ඕනෑම වේලාවක උන් වහන්සේ හමුවී කළහ. ඒවා කරදර හැටියට නොසිතූහ. උන් වහන්සේගේ කාර්යාලය ලඟ මුරට සේවකයෙක් නොසිටියේ ය. ඇතැම් අය අත උස්සා රිය නවත්වා ඇතැම් දුක් ගැණවිලි කියූහ. මෙබඳු අවස්ථා ගැන උන් වහන්සේ කිපුනේ නැත. විද්‍යොදය පරිවෙණාධිපතිව සිටි කාලයෙහිදීට වඩා සිය ගුණයකින් විශ්වවිද්‍යාලයාධිපති වීමෙන් පසු නිහතමානී වූහ. ලං විය හැකි වූහ. අහිංසක වූහ. කාරුණික වූහ. අනුකම්පා සහගත වූහ. උන් වහන්සේ අතිශයින් කෘතඥ වූහ. එබැවින් ම විශ්ව විද්‍යාලය ආරම්භ කිරීමේදී අතිශය අගනා දක්ෂ සහායක් දුන් ආනන්ද ගුරුගේ මහතාගේ හා ප්‍රමුඛාචාර්ය පණ්ඩිත පලන්නොරුවේ විමලධම්ම නායක හාමුදුරුවන්ගේ ත් සේවය අගය කොට සැලකූහ. ඒ ගැන නිතර කථා කළහ.

නවීන ශාස්ත්‍ර දියුණුවෙන් සකස් වී ඇති කාර්යාලීය වැඩ ක්‍රමය භික්ෂූන්ට පුරුදු නැත. පැරණි තාලයට පුටුවක් මේසයක් තබාගෙන ශිෂ්‍ය පිරිසකට උගැන්වීම කළ පිරිවෙණක් හදිසියේ නවීන ක්‍රමයේ සියලු අංගෝපාංගයන් ගෙන් යුත් විශ්ව විද්‍යාලයක් බවට පෙරලීම ඉතා අරුම පුදුම සිද්ධියකි. විද්‍යොදය විශ්වවිද්‍යාලයයේ කාර්යාලයීය සම්පාදනයත් අධ්‍යයන ක්‍රම සම්පාදනයත් පිළිබඳව ආචාර්ය ආනන්ද ගුරුගේ මහතාගෙන් වූ සේවය අන් කවුරුන් අමතක කළත් කෘතඥ ගුණයෙන් අනූනවූ සෝරත නාහිමියන් අමතක නොකළ බව මෙහි සඳහන් නොකළහොත් උන් වහ්නසේගේ චරිත කථාව සම්පූර්ණ නොවනු ඇත.

විද්‍යොදය විශ්වවිද්‍යාලය විවේචනය කරන්නන් ගංගොඩවිල විශ්ව විද්‍යාල භූමියට පැමිණිය යුතුය. අවුරුදු දෙක තුනක් වැනි ඉතා සුළු කාලයක් තුළ මහල් හතර පහේ විශාල ගොඩනැගිලි රාශියක් පැන නැංගේ කුමන ප්‍රාතිහාර්යයක බලයකින්දැයි කෙනෙකු මවිත වනු ඇත. දවල් දහයට එකොළහට පමණ, මහ දවල් මහ කට්ට අව්වේ කුඩයක් ඉසලා ගෙන ගොඩනැගිලි ලඟ ඇවිදිමින් ඉංජිනේරු වරුන්ට උපදෙස් දෙමින් ඒවා පරීක්ෂාකරණ විශ්ව විද්‍යාලයාධිපතීන් වහන්සේ ඒ දිනවල ඔබ එහි ගියෙහි නම් දක්නට ඇත. උන් වහ්නසේ වැඩ කළ සේක. ලාබ කීර්ති ප්‍රසංසා නොතකා මහන්සිය නොබලා වැඩ කළ සේක. අනුන්ගේ ප්‍රයෝජනය තකාම වැඩ කළ සේක. පසුගිය වර්ෂ දෙක තුළ කොතරම් මහන්සි උනාදැයි කියතහොත් වර්ෂ දහයකට පසු ලැබිය යුතු මහලු භාවය උන් වහන්සේගේ මුහුණ තුලින් දිස් වෙන්නට විය. නිරෝගී දිලිසෙන සිරුරෙහි වැහැරි ගිය ළකුණු දිස් වෙන්නට විය. උන් වන්සේ ළදරු විද්‍යොදය විශ්වවිද්‍යාලය තරුණ කළහ. තරුණ උන් වහන්සේ ඒ නිසාම මහලු බව වැළඳ ගත්හ. දැන් සෝරත නාහිමියන් දැක්ක හැක්කේ විද්‍යොදය පිරිවෙණෙහිදී නොවේ, හික්කඩුවේ තිලකාරාමයෙහි දී නොවේ, නලාගස්දෙනියේ ශ්‍රී නාගාරාමයෙහි දී නොවේ. එසේ නම් කොහිදීද? ගංගොඩවිල විද්‍යොදය විශ්ව විද්‍යාලයේදීය, විද්‍යොදය විශ්ව විද්‍යාලය නම් සෝරත නාහිමියෝයි. සෝරත නාහිමියෝ නම් විද්‍යොදය විශ්වවිද්‍යාලයයයි.

විද්‍යොදය ගිහි පැවිදි ශිෂ්‍යයන් අතර නාහිමියන් නියම හැටියට අඳුනා ගත්තෝ ස්වල්පයකි. වැඩි දෙනා උන් වහන්සේගේ නියම තත්වය නොදත්හ. එහෙත් කල් යත්යත් ශිෂ්‍යයන්ගෙන් බොහෝ දෙනා අඳුනා ගන්නට වූහ. ඉන් පසු ශිෂ්‍යයෝ උන් වහන්සේට මහත් ගෞරව ආදර දක්වන්නට වූහ. උන් වහන්සේ රුසියාවට වැඩිය දින රත්මලානට පැමිණි ගිහි පැවිදි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් ඒ බව හිතා ගත හැකිය. කෙසේ හෝ විශ්ව විද්‍යාලයයේ ශිෂ්‍යයන් සෝරත නාහිමියන් වහන්සේ හොඳින් හැඳින ගන්නා විට උන් වහ්නසේ ජීවතුන් අතර නැත. විද්‍යොදය විශ්වවිද්‍යාලයයේ ශිෂ්‍යයන්ට ස්ථාවර විශ්වවිද්‍යාලයක් හා ජංගම විශ්වවිද්‍යාලයයක් යයි දෙකක් තිබුනේ ය. ඉන් එකක් නැති විය. අනික ඉතිරි විය.

## දක්ෂ ග්‍රන්ථ කර්තෘවරයා

සෝරත නායක මාහිමියන් ලියූ ග්‍රන්ථ බොහෝය. ඉන් ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය පමණක් වුවත් උන් වහන්සේගේ නාමය අමරණීය වීමට ප්‍රමාණවත් ය. මේ ගැන නොයෙක් දෙනාගේ ප්‍රසිද්ධ ප්‍රකාශවලින් කීපයක් මෙසේ ය.

සිංහලය රජයේ භාෂාව කිරීම සඳහා නොයෙක් ප්‍රයත්නයන් දරනු ලබන මේ කාල පරිච්ඡේදයෙහි සිංහලයට ප්‍රමාණවත් වූ ශබ්ද කෝෂයක් සැපයීම අතිශයින් උත්කෘෂ්ඨ වූ කර්තව්‍යයකි. රජය මගින් සවිස්තරව සම්පාදනය කරනු ලබන ශබ්ද කෝෂය නිම කිරීමට තවත් දීර්ඝ කාලයක් ගතවන හෙයින් දැනට ප්‍රමාණවත් ශබ්ද කෝෂයක් නොමැති කමේ පාඩුව මෙම ග්‍රන්ථය නිමවූ විට බොහෝ දුරට පිරිමැසේ. මෙම ශබ්දකෝෂයාගේ සම්පාදනය මහත් පරිශ්‍රමයකින් කොට ඇති බැව් කාහටත් පෙනී යා යුතුය. විශාල පිරිසක් දීර්ඝ කාලයක් ගතකොට රජයෙත් බලවත් අනුග්‍රහයෙන් කළයුතු වැඩක් එක උතුමෙකු ස්වල්ප දෙනෙකුගේ සහාය ඇතිව අවුරුදු කීපයක් තුළදී කරන විට යම් සුළු අඩුපාඩුකම් ඇතිවීම පුදුමයකට කරුණක් නොවේ. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ අවශේෂ භාගයද ඉක්මනින් නිමවා මහජනයා අතට පත් කරලීම සඳහා රජයේ නොමසුරු පරිත්‍යාගයද ආයුරාරෝග්‍ය සම්පත්තියද පණ්ඩිත සෝරත නායක ස්ථවිර පාදයන් වහන්සේට ලැබේවා යනු අපේ ප්‍රාර්ථනයයි. (ඩී.ජී. හෙට්ටිආරච්චි. ලංකා විශ්ව විද්‍යාලය.-දිනමිණ 1952 ඔක්තෝබර් 7 වැනි දින.)

දුර්බෝධව පැවති කව්සිළුමිණ ආදී ඉතාමත් වැදගත් සිංහල සාහිත්‍ය කෘතියකටම උන් වහන්සේ විසින් කළ විස්තර ව්‍යාඛ්‍යා සහිත සැකසුම් නිසා සිංහළ භාෂාව උගන්නවුන් මෙන්ම උගන්වන්නෝද උන්වන්සේට මහත් නය ගැතිව සිටිත්.  උන් වහන්සේ විසින් සම්පාදනය කළ පසුගිය මාසයේදී ප්‍රකාශයට පත්වූ ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි ප්‍රථම භාගය එම නය සිය දහස් ගුණයෙන් වැඩි කරයි. මේ හිමිපාණන් වහන්සේ ඉතා කරදර සහිත බාරදූර වැඩය ඇරඹීමේ හේතුව ශබ්දකෝෂයෙහි දීර්ඝ සංඥාපනයෙහි පැහැදිළි කරති. මීට පස්විසි වසකට පෙර මහත් වෑයමකින් හා වියදමකින් ඇරඹූ සිංහළශබ්දකෝෂයෙන් වත්මන් පරපුරට වහළක් නොවන බව පෙණීම මේ ශබ්දකෝෂයෙහි ආරම්භයට හේතුව බව එයින් පැහැදිළි වෙයි. මේ ඇරඹුම වූයේ ඉතා මෑතකදීය. එනම් 1946 මැද භාගයේදීය. එහි ප්‍රථම භාගය දැන් උගතුන් ඉදිරියේ ය. මේ ශබ්දකෝෂ සම්පාදකයන් වහන්සේට සම්බන්ධ විදුදය පිරිවෙණ ලෝක ප්‍රකටය. දැන් ඇති හැම විද්‍යාස්ථානයකටම වඩා පාරම්පරික ධර්ම ශාස්ත්‍රාධ්‍යාපනයට හා ප්‍රාචීන පාණ්ඩිත්‍යයටද සදාදීප්ත්‍යමාන උල්කාවක් වැනිය. මේ සිංහළ ශබ්දකෝෂයට සිරි සුමංගල ශබ්දකෝෂය යන නම තබන ලද්දේ ඒම හා විද්‍යාලයයෙහි ආදි කර්තෘ වූ හික්කඩුවේ සිරි සුමංගල මාහිමියන් වහන්සේගේ ශ්‍රී නාමය සිහි කරවීමටයයි සිතමු. එසේ නම් එය අතිශය ප්‍රශංසාර්හය. මේ විද්වත් කෘතිය සම්පූර්ණ වූ විට මෙයට ඒ ශ්‍රේෂ්ඨ නායක මාහිමියන් වහන්සේ ගේ ශ්‍රී නාමය චිරස්ථායී වීමට ගලින් හෝ ගඩොලින් කළ ස්මරණස්ථම්භයකටද වඩා උත්තම කෘතියක් වන්නේමය. (සෙනරත් පරණවිතාන මහතා. 1952.10.12 සිළුමිණ).

ශබ්දයක් නැති ශබ්දකෝෂයඃ වැලිවිටියේ පණ්ඩිත සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සකස් කරන ලද ශ්‍රී සුමංගල ශබ්දකෝෂය නිම වී දැන පිටවී තිබේ. මෙහි කාහට වුවත් නොඅනුමානවම ඇසීමට සිදුවන ප්‍රශ්නයක් නම් අපේ විශ්වවිද්‍යාලයයේ ලොකු මහතුන්ට භාරදෙන ලද ශබ්දකෝෂය දැන් හිර වී තිබෙන්නේ කොතැනද යන්නය. නිරුක්ති සහිත ඒ ශබ්ද කෝෂය ගැන කිසිම ශබ්දයක් නොමැති වීමත් සෝරත ස්වාමීන්ගේ කෘතිය මනා සේ ඉටුවීමත් නිසා පැන නගින ප්‍රශ්න කීපයකි. වැඩක් ගැන ආශාවක් නැති මිනිසුන් මොනම කටයුත්තක් වත් බාර ගැණීම හරි නැත. එවැනි උදවියට එම වැඩේ බාරදීම ඊටත් වඩා වැරදිය. විශ්වවිද්‍යාලයට බාරදුන් ඒ ශබ්දකෝෂය ගැන දැනට මාස කීපයකට පෙර ප්‍රශ්න කළ විට කියන ලද්දේ මුද්‍රණ කටයුතුවල අඩුපාඩුකම් නිසා ඒ වැඩය ප්‍රමාද වී තිබෙන බවයි. එහෙත් ඒ සමගම හෙළිවූ තවත් කරුණක් නම් ඒ වැඩය තවමත් (අ)නෙන් එහාට ගමන් කොට නැති බවය. (දිනමිණ කතෘ වාක්‍ය 1956 මාර්තු 10).

## "ගම්වරයකින් පිදිය යුතු ශාස්ත්‍රීය සේවයක්"

ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ ප්‍රථම භාගය එළිය දුටුවේ 1952 දීය. එයින් ප්‍රයෝජන ලදුවෝ ද්විතීය භාගය එන තුරු නොයිවසිල්ලෙන් සිටියහ. 1956 දී අපේක්ෂිතයන්ගේ මනදොළ පුරවමින් එහි ද්විතීය භාගයද කල එළි බැස්සේ ය. රාජකීය පණ්ඩිත සෝරත නාහිමි පාණෝ සාහිත්යික ලෝකයාට හඳුන්වා දිය යුත්තෝ නොවෙති. සිංහලෙන් මෙවැනි කෘතියක් කිරීමෙහි සම්පූර්ණ අයිතිය හා ශක්තිය උන් වහන්සේට ඇති බව අපක්ෂපාත සැම දෙනාම පිළිගණිති. පිටු 1199 කින් පරමිත සම්පූර්ණ ශබ්දකෝෂය

සඳහා උන් වහන්සේ ට ගතවී තිබෙන්නේ අවුරුදු අටකි. සර් හියුක්ලිපර්ඩ් (1925-27) ආණ්ඩුකාරයාගේ කාලයේ ලංකාණ්ඩුව මගින් ආරම්භ කළ ශබ්දකෝෂය කවුරුන් කළත් කොහොම කළත් එයින් තවම බිහිවී ඇත්තේ යම්තම් අංගෝපාංගයන් පමණි. සම්පූර්ණ ශබ්දකෝෂය තවම හීනයකි. මේ වැඩය කෙරගෙන යන ගොළු බෙලි ගමනේ හැටියට කවදා කෙසේ කෙළවර වේදැයි සිතා ගැන් ම පවා දුෂ්කරය. (දෙගම්මැද සුමනජෝති හිමි. 1956 අගෝස්තු 17 ලංකාදීප පත්‍රය).

මෙතෙක් විදුදයේ පහළවූ කිසිම ගිහි පැවිදි කෙනෙකු අතින් නොලිය වුන තරම් පොත් ගණනක් ලියවී, මේ විසි වන ශතවර්‍ෂයේ නැගී ආ ලංකා සාහිත්‍යට මහත් සේවාවක් සෝරත නාහිමියන් අතින් සිදුවූ අයුරු විදුදය අනාගත ඉතිහාසයෙහි පෙනී යනවා ඇත. මෙරට ධර්මශාස්ත්‍රොන්නතිය අරභයා සෝරත නාහිමියන් අතින් ලියවුන පොතපත පිළිබඳ තොරතුරු කථාව පසෙක තිබේයේවා. උන් වහන්සේ කළ ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය වර්තමාන මහා පඬිවරයෙකු අතින් බිහිවුනු මහා සාහිත්‍ය සංග්‍රහය හැටියට මේ රටේ ඉහළින්ම බැබලෙනු අපට පෙනේ. ඒ අතර ලංකා බෞද්ධ මණ්ඩලය ඇරඹූ ත්‍රිපිටක පරිවර්තන සභාවේ මුලසුන ගෙන කරන සේවයද අමතක නොවන්නකි. පැරණි පිළිවෙළින් නවීන විශ්වවිද්‍යාලයට පත්වුනු සංධිස්ථානයද සෝරත යුගය වෙයි. එහෙයින් විද්‍යොදය අනාගතය දකින්නාට හික්කඩුවේ නම ලඟට වැලිවිටියේ නම දිස්වෙනු නොවැළැක්විය හැකිය. අපේ රටේ ජාතික උරුමයේ නියම තතු විද්‍යෝදය විශ්වවිද්‍යාලයයෙන් ඇති කළ හැකිවීමේ සම්පූර්ණ ශක්තිය සෝරත නාහිමියන වෙත පවතී. ඒ සඳහා සෝරත නාහිමියන්ට හික්කඩුවේ නාහිමියන්ගේ වරමද ලැබෙනු ඇත. (පුංචි බණ්ඩාර සන්නස්ගල ශ්‍රී සුමංගල 62 පිටුව).

## ලියූ ග්‍රන්ථ ගැන කෙටි හැඳින්වීමක්

**ප්‍රාකෘත සූක්ති මඤ්ජරිය** නමැති කුඩා ග්‍රන්ථය නාහිමියන් විසින් සංග්‍රහ කරන ලද්දේ ශිෂ්‍යයකු වශයෙන් ඉගෙන ගනිද්දීය. මෙහි අඩංගු ප්‍රාකෘත ගාථා ශ්‍රී සාතවාහන මහා කවියා විසින් රචිත ගාථා සප්තසති නැමැති ගාථා සත්සියයකින් යුත් ප්‍රාකෘත කොෂ ග්‍රන්ථයෙන් උපුටාගත් ඒවායි. මේ ග්‍රන්ථය සෝරත නාහිමියන්ගේ ප්‍රාකෘත භාෂාඥානයට හොඳම සාක්ෂියකි. **සිංහල දශ කුමාර චරිතයඃ** මෙය දශකුමාර චරිත නමැති සුප්‍රසිද්ධ සංස්කෘත ගද්‍ය කාව්‍යයේ සංක්ෂිප්ත අනුවාදයකි. මේ ග්‍රන්ථයෙන් නාහිමියන්ගේ සංස්කෘතඥානය ප්‍රකට වේ. **වෘත්තරන්තාකර සරලාව්‍යාඛ්‍යාවඃ** මෙතෙක් වෘත්තරත්නාකරයෙහි සඳහන් සංස්කෘත වෘත්ත හා ඡන්දස් වටහා ගැනීම සංස්කෘත ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට මහත් දුෂ්කර කාර්යයක්ව පැවැත්තේ ය. නාහිමියන්ගේ මේ ශ්‍රෙෂ්ඨ ව්‍යාඛ්‍යාව සංස්කෘත ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ගේ සිත් තදින් ඇද ගෙන ඇත. **සෞන්දරනන්ද** කාව්‍යය අශ්වඝොෂ හිමියන්ගේ ශ්‍රෙෂ්ඨ කෘතියක් වූ මෙය ප්‍රථම වරට මුද්‍රණය කොට ඉංග්‍රීසියට පරිවර්තනයක් කළේ ජොන්ස්ටන් පඬිවරයා විසිනි. සෝරත නාහිමියෝ මෙයට සන්නයක් ලියමින් ජොන්ස්ටන්ට වැරදී ඇති නැත්ද දක්ෂ ලෙසින් පෙන්වති. සෞන්දරනන්ද කාව්‍යයට මෙතෙක් ලියැවී ඇති හොඳම සන්නයත් ප්‍රස්තාවනාවත් මෙය බවත් මෙය කියැවූ විද්වතුන් රැසකගේ එකමතික තීරණයයි. මේ ග්‍රන්ථය මෙතෙක් මුද්‍රණය නොවීම ලක්දිව සංස්කෘත සාහිත්‍යාභිලාෂීන්ගේ මහත් අවාසනාවකි. **බුත්සරණඃ** විද්‍යාචක්‍රවර්තීන්ගේ කෘතියක් වූ මේ අගනා ගද්‍ය ග්‍රන්ථය සිංහල උගතුන් අතර ප්‍රකටවූයේ සෝරත නාහිමියන් කළ මුද්‍රණයෙන් පසුවය. මෙහි දක්නට ඇති සිංහල ගද්‍ය ශෛලිය අතිශයින් අගනේය. සිංහල ලියන්නන්ට බුත්සරණය ගුරු පොතක් වැනි ය. සෝරත නාහිමියනගේ දක්ෂ සංශෝධනය නිසා මේ පොත අතිශයින් ප්‍රකට විය. මෙයට ඉතා අගනා ගැටපද විවරණයක් ද ලියා ඇත. **කව්සිළුමිණ කල්පලතා ව්‍යාඛ්‍යාවඃ** කව්සිළුමිණේ ගී වල අර්ථය දත නොහැකි කමින් ශිෂ්‍යයන් වින්ද කරදර මග හැරී ගියේ මේ කල්පලතා ව්‍යාඛ්‍යාවෙන් පසුව ය. සෝරත නාහිමියන්ගේ සිංහල භාෂාඥානය මැන ගැනීම සඳහා කල්පලතා ව්‍යාඛ්‍යාව හොඳම කෝදුවකි. බොහෝ දෙනෙකුගේ අවිචාරක සංශොධන නිසා ආකුල ව්‍යාකුල බවට පත්ව තුබුණු මේ මහා කාව්‍යයෙහි නියම වටිනාකම වටහාගත හැක්කේ  මේ කෘතියෙන් බව අවිවාදයෙන් පිළිගැනේ. **අමාවතුරඃ** සිංහල ගද්‍ය සාහිත්‍යයෙහි මුදුන් මල් කඩක් වැනි අමාවතුර ජනප්‍රිය කළේ සෝරත නාහිමියන් විසිනි. එයට අගනා ගැටපද විවරණයක් ද උන්වහන්සේ විසින් ලියා ඇත.

## ශ්‍රී සොරත යුගය

ශ්‍රී සුමංගල යුගය, ශ්‍රී ඥානේශ්වර යුගය, ශ්‍රී රතනසාර යුගය, ශ්‍රී පියරතන යුගය යයි විද්‍යොදය පිරිවෙන් ඉතිහාසය යුග පහකට බෙදිය හැකිය. මින් ඉතා සැළකිය යුතු යුග දෙක ශ්‍රී සුමංගල යුගය හා ශ්‍රී සොරත යුගයත් ය. ශ්‍රී සුමංගල යුගය විද්‍යොදය පිරිවෙනේ ආදි කර්තෘවරයාගෙන් ආරම්භවිය. ශ්‍රී සෝරත යුගය විද්‍යොදය විශ්වවිද්‍යාලයේ ආදි කර්තෘවරයාගෙන් අලංකාරවිය. ශ්‍රී සෝරත නාහිමියන් පහළ වූයේ ශ්‍රී සුමංගල මාහිමියන් පහළ වූ පන්සලෙහිමය. එබැවින් මේ උතුමන් දෙදෙනාම එක්කෙනෙක්

දෝයි අනුමාන කළහැකිය. ශ්‍රී සෝරත යුගයේදී විද්‍යොදය පිරිවෙණ විශ්වවිද්‍යාලයක් බවට පත්විය. අභිනව දෙමහල් ගොඩනැගිල්ලකින් එක් විය. විද්‍යොදය ගිහි පැවිදි ශිෂ්‍යයන් දහස් ගණනකින් පිරී ගියේය. පැරණි පාලු ගතිය නැතිවී ගියේ ය. විද්‍යොදය පිරිවෙණට නව ජීවයක් ලැබුනේ ය. එබැවින් ශ්‍රී සෝරත යුගය විද්‍යොදය ලැබූ ශ්‍රේෂ්ඨතම යුගය විය. සෝරත නාහිමියන්ගේ නාමයෙන් විද්‍යොදය පිරිවෙණට මහත් ආශීර්වාදයක් ලැබුනේය.

## සිදුකළ නොයෙක් ශාසනික සේවා

සොරත නාහිමියෝ පොත් ලියූහ. ඒ හැම පොතක් ම ප්‍රයෝජනවත් විය. පාඨකයෝ රුචි කළහ. ඇතැම් පොත් දෙතුන්වර මුද්‍රණය කළහ. එයින් සෑහෙන මුදලක් ලැබුනේය. ඒ ලැබුනු හැම සතයක් ම ශාසනයේ දියුණුවට යෙදවූහ. දොෂාරොපණ ලැබිය හැකි කිසි ම වැඩක නොයෙදූහ. ස්වකීය විහාරස්ථානයක් වූ හික්කඩුවේ නලාගස්දෙනියේ විහාරස්ථානය සඳහා රු. 80,000 ක් යොදවා එය අගනා විහාරස්ථානයක බවට පත් කළහ. පාසැල් ගොඩනැගිල්ලක් තනවා දුන්හ. හික්කඩුවේ තිලකාරාමයට රු. 8,000 ක් යෙදවූහ. විශ්වවිද්‍යාලයාධිපති ධුරයට ලැබුනු දීමනාවෙන් ඉතා ස්වල්පයක් හැර වැඩි කොටස විශ්වවිද්‍යාලයටම දුන්හ. මේ උන්වහන්සේට ලැබුනු මුදල්වලට කළ කී දේය.

හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණ සභාව මගින් මුද්‍රිත අටුවා පොත් රාශියක් ශුද්ධකර දුන්හ. බුද්ධජයන්ති ත්‍රිපිටක පරිවර්තන සභාවේ සභාපති ධුරය දරමින් විශාල සේවයක් කළහ. බුරුමයේ පැවති ඡට්ඨසංගායනාවේදී ලංකාණ්ඩුවේ නියෝජිත පිරිසේ ප්‍රධානියා වශයෙන් එහි ගොස් එයට සහභාගි වූහ. ඒ ඒ කලට යෙදුනු හැම ආගමික ජාතික සේවයක ම මුල් තැන ගණිමින් වර්තමාන භික්ෂු සමාජයේ ඉතාම ප්‍රයෝජනවත් සංඝ පිතෘවරයකු වශයෙන් වැඩ කළහ.

උන්වහන්සේගේ හාමුදුරුකම උගත් කමට යට කළේ නැත. උගත්කමත් හාමුදුරුකමත් එකසේ ම රැකගත්හ. උගත්කමෙන් මහණකමේත් සීමාවන් ඉක්මවා නොගියහ. එබැවින් ම මුලු ලංකාවම උන්වහන්සේ නියම සංඝ පිතෘවරයකු ලෙස පිළිගත්තේ ය.

## සොරත නාහිමියන්ගේ වටිනාකම

මම සියම, බුරුමය හා කාම්බෝජය යන ථෙරවාද බෞද්ධ රටවලට ගියෙමි. එහි දී නොයෙක් තරාතිරමේ භික්ෂූන්වහන්සේලා හමුවීමි. ඔවුන් සමග කථා කළෙමි. ආශ්‍රය කළෙමි. ඒ අනුව මා කියන්නේ සෝරත නායක හාමුදුරුවන් තරම් අංගසම්පූර්ණ පඬිවරයකුත්, අංග සම්පූර්ණ පැවිදිවරයකුත් එක් වීමෙන් තැනුනු සාර්වභෞම මහා සංඝ පිතෘවරයෙක් ලෝකයේ අනික් කිසිම බෞද්ධ රටක නැති බව යි. සෝරත නායක හාමුදුරුවන් වහන්සේ ගේ අපවත්වීම, මේ රටේ භික්ෂූන්වහන්සේලා දහසක් එක විට අපවත්වීම තරම් ලංකා භික්ෂු සාසනයට වැදුණු මරු පහරකි. සෝරත හාමුදුරුවන්ට සමාන කළහැකි කෙනෙක් උන්වහන්සේ ම හැර වෙන නැත. රටක්, ජාතියක් විසින් ආඩම්බර විය යුතු දෙතුන් දෙනාගෙන් උන්වහන්සේ ද එක් කෙනෙකි. විද්‍යොදය පිරිවෙණට පරණවිතාන මහතා වැනි මහා උගතුන් නිතර නිතර පැමිණියේ සෝරත නා හිමියන් හමුවීමට ය. උන්වහන්සේගේ කුශාග්‍ර බුද්ධිමත්භාවය සොයාගෙන ය. තව ශතවර්ෂ ගණනකින් සෝරත නාහිමි කෙනෙක් මේ රටේ භික්ෂූන් අතර පහළ වෙත් ද යනු සැකසහිත ය. වර්තමාන පඬිවරුන් දහසක් සෝරත නාහිමියන්ගේ පෘථුල පණ්ඩිත කම තුළ එබිය හැකිය. පඬිවරුන් දහසක බුද්ධියත් පැවිදිවරුන් දස දහසක අහු පැවතත් එක සෝරත නා හිමියන් දෙවියකු කරන්නට යත්න දරන්නේ නොවෙමි. මා මේ ලියන්නේ උන්වහන්සේගේ මිනිස් ගති, මානුෂික ගුණ ඇති සැටියෙනි. උන් වහන්සේ නිකම් සිටීම, බිමට බුම්මාගෙන සිටීම, බිම බලාගෙන නිකම් සිටීම මහා සිල්වත් කමක් හැටියට නො සැලකූහ. වැරදි වැඩ නොකර විසූ මහා සීලවන්තයා යයි මම නිර්භයව ම කියමි. කුහක කම බුද්ධාගමේ සඳහන් මහා පාපයක් බව සැබෑ නම්, මා කියන්නේ සෝරත නා හිමියන් තරම් කුහක කම ඉඳිලාවත් නැති කෙනෙක් මේ රටේ වෙන නැත කියා යි. අහෝ ලක් මවුනි! මේ ඔබට වැදුනේ මරු පහරක් නොවේද? පිරවිය නොහැකි ඉවසිය නොහැකි පාඩුවක් නොවේ ද?

## භික්ෂූන් වහන්සේලාට ආදර්ශයකි

පැරණි පන්සල් අධ්‍යාපනය නැති වී නවීන අධ්‍යාපනය ලක්දිව පැතිර යෑමත් සමග ම භික්ෂූන් වහන්සේලා කිසි වැඩක් කළ නොහැකි, ලෝකය ගැන නොදත් නිකම් ම සිටින පිරිසක් ලෙස ඉංග්‍රීසි අධ්‍යාපනය ලත් සමහරු සිතන්නට පටන් ගත්හ. පන්සලක පිරිවෙණක අධිපතිකමක් කරනු මිස

විශ්වවිද්‍යාලයක් මේ රටේ භික්ෂූන් වහන්සේ නෙකෙකුට පාලනය කළ හැකැ යි කිසිවෙක් නොසිතූහ. සෝරත නායක මා හිමියෝ ඔවුන්ගේ ඒ දුර්මතයට පිළිතුරු දුන්හ. දක්ෂ උගත් භික්ෂුවකට මේ රටේ කොතරම් වැඩ කළ හැකිද යන්න සෝරත නාහිමියෝ හොඳම සාක්ෂියකි. භික්ෂූන් පාලන ශක්තියක් නැති, වැඩක් හරියට කළ නො හැකි පිරිසකැ යි සිතා සිටින්නන් ගංගොඩවිලට ගියොත් මවිත වනු ඇත. එබැවින් උන්වහන්සේ ලක්දිව භික්ෂු සංහතියට ගෙන දුන් ගෞරවය ගැන සියලු භික්ෂූන් වහන්සේට ගෞරවයකි; නම්බුවකි; ආඩම්බරයකි; ආදර්ශයකි. මේ රටේ හැම භික්ෂුවක්ම සෝරත නාහිමි කෙනෙකු වන්නට උත්හාස ගත යුතුය. ඒ සඳහා උන්වහන්සේගේ ශ්‍රෙෂ්ඨ ක්‍රියා කලාපය අනුගමනය කළ යුතුව ඇත.

## රුසියාවට යෑම

සෝරත නා හිමියන් වහන්සේට විදේශ වලට යෑමට ඕනෑ කළේ විදේශවල ඇති විශ්වවිද්‍යාලයන් පරීක්ෂා කොට, ඒවායේ ගොඩනැගිලික්‍රම, අධ්‍යාපන ක්‍රම හා පුස්තකාලය සකස් කිරීම් ආදියෙන් ස්වකීය විශ්වවිද්‍යාලයට ගත හැකි ක්‍රම ගෙන ගනු සඳහා ය. උන්වහන්සේ ඉන්දියාවට ද ගොස් එහි විශ්වවිද්‍යාල පරීක්ෂා කොට ද පැමිණිය හ. රුසියානු ආණ්ඩුවේ හා එහි බෞද්ධ සංගමයේ ආරාධනය පරිදි ලක්දිව පිරිවෙන් විශ්වවිද්‍යාලය දෙකේ අධිපති මා හිමිවරුන් ට හා තවත් කීප නමකට එහි යෑම සඳහා ආරාධනා ලැබුනේ ය. මේ ආරාධනය ලැබෙන විට සෝරත නා හිමියන් වහන්සේ උදරාබාධයකින් පෙළෙමින් සිට තරමක් සුවයට පත් වුනා පමණකි. එහෙත් ආරාධනය පිළිගත් හ. හිතවත් කීප දෙනෙකුන් එහි නොවඩින ලෙස උපදෙස් දුන් නමුත්, එබඳු දියුණු රටවලට යෑමෙන් ලැබිය හැකි විපුල ප්‍රයෝජනය ගැන නා හිමියෝ කරුණු කීහ. කෙසේ හෝ දිනය ලංවිය. ගමනයට අවශ්‍ය දෑ සම්පාදනය විය. විශ්ව විද්‍යාලයේ ස්වකීය කාර්‍ය්‍යාලයෙන් පිටත් වෙන් ට විනාඩි දහයක් තිබිය දී උන්වහන්සේ හමුවන්ට පැමිණි ඉංජිනේරු මහතෙකු සමග කථා කරමින් ප්‍රමුඛාචාර්‍ය්‍ය වරුන්ගේ ප්‍රයෝජනය සඳහා දනට තනාගෙන යන ගොඩනැගිල්ලක තිබිය යුතු සැප පහසුකම් ගැන විස්තරයක් කළහ. ඉන්පසු බස්රිය හයට පරී සිටි ගිහි-පැවිදි විශාල ශිෂ්‍ය පිරිස සමග ගංගොඩවිල සිට ම රිය පෙරහැරකින් රත්මලානේ අහස් යාත්‍රාංගනයට වැඩිය හ. ඉන් පෙර කිසි කලෙක එහි නො පැමිණි තරම් විශාල භික්ෂු සමූහය නිසා මුළු අහස් යාත්‍රාංගනය ම කාෂාය වර්ෂයෙන් දිලිසෙන්නට විය. දහස් ගණනක් හිතවතුන් ගේ ආශීර්වාද මධ්‍යයෙහි සෝරත නායක මා හිමියෝ සෙසු නියෝජිතයනුත් සමග රුසියාවට බලා පිටත් වූහ.

## රුසියාවේ දී අසනීප වීම

දීර්ඝ ගමනින් හා නුපුරුදු දේශ ගුණයෙන් ද, අතරක් නැතිව පැවති වැඩ සටහනින් ද, විඩාවට පත් සෝරත නා හිමයෝ තෙහෙට්ටු ගතියට පත් වූහ. එහි දී ලැබුනු තෙල් මිශ්‍ර රුසියන් ආහාර රුචි නො කළහ. වරින්වර තෙහෙට්ටු බවට පැමිණියෙන්, රුසියානු වෛද්‍යවරයකු ගේ ප්‍රතිකාර ලබා ගත් හ. ලක්දිව දී තිබුණු උදරාබාධය ගැන රුසියන් විශෙෂඥයකු ලවා පරීක්ෂා කරවනු පිණිස ආරොග්‍ය ශාලාවක තෙදිනක් නතරව සිටියහ. නියමිත දින ගෙවා ආපසු ලක්දිවට වඩින විට බොහෝ වෙහෙස වී වැහැරුණු බවක් දක්වූහ. පසු දින ම විවේක ගනු සඳහා කොළඹ මහාරෝග්‍ය ශාලාවට ඇතුල් කරණු ලැබූ නායක මා හිමියන් වහ්නසේ විජයනායක දොස්තර මහතාගේ ප්‍රතිකාර යටතේ විසූහ. ජූලි මස 14 වැනි දා හදිසියේ රෝග තත්වය උත්සන්න විය. සෞඛ්‍ය අමාත්‍ය බදියුද්දීන් මහමුඩ් මැතිතුමා පැමිණ අවශ්‍ය දොස්තරවරුන් ගෙන්වා සාකච්ඡා කොට අවශ්‍ය නම් පිට රටින් වුවත් විශෙෂඥයින් ගෙන්වා දීමට ආණ්ඩු ව කැමති බැව් කියා ගියේ ය. අග්‍රාණ්ඩුකාරතුමා ද, සී.පී. ද සිල්වා, මෛත්‍රීපාල සේනානායක, ඉලංගරත්න, ඩී. එස්. ගුණසේකර ආදී අමාත්‍යවරු ද ඩඩ්ලි සේනානායක, ඒ. රත්නායක ආදී මන්ත්‍රී වරු ද, ඇන්. කියු. ඩයස්, එච්. ජිනදාස, නිශ්ශංක විජේරත්න, ඇම්.ජී. පෙරේරා, වින්සන්ට් පණ්ඩිත, පාලිත වීරමන් ආදී උසස් නිලධාරීහු ද වරින්වර පැමිණ ගියහ. දිනපතා දහස් ගණන් ගිහි-පැවිදි පිරිස් ද නාහිමියන් බලනු සඳහා මහාරෝග්‍ය ශාලාවේ අභිනව ගොඩනැගිල්ලේ පස්වැනි මහල කරා වැල නොකැඩී එන්ට වූහ. ඩබ්ලිව්. විජයනායක, ඇස්.ඒ. කබ්රාල්, ජී.ඇස්. රත්නවේල්, කේ. රාජසූරය, ඩී.ජේ. ආටිගල, පී.ආර්. ඇන්තනීස්, කේ.ජී. ජයසේකර යන විශෙෂඥ දොස්තරවරුන් කණ්ඩායමක් නායක මා හිමියන් භාරව සිටිය හ. නා හිමියන් ගේ තත්ත්වය හොඳ අතට හැරී නැති බැව් ඇසූ අගමැතිනිය හා අග්‍රාණ්ඩුකාර තුමාද පිටරටින් වෛද්‍ය විශෙෂඥයන් ගෙන්වන ලෙස සෞඛ්‍ය ඇමතිතුමාට උපදෙස් දුන්හ. රුසියන් තානාපතිවරයා ද පැමිණ රුසයන් වෛද්‍ය විශෙෂඥයකු කැඳවීමට කැමැත්ත පළ කළේ ය. තානාපති කාර්‍ය්‍යාල මගින් ඉන්දියාවට හා රුසියාවට විදුලි පුවත් යවනු ලැබී ය. මදුරාසියේ

විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය අංශයෙහි ප්‍රමුඛාචාර්ය ඒ.ඇල්. අන්නාමලේ දොස්තර මහතා ද උන්වහන්සේට ප්‍රතිකාර කරනු වස් ලංකාවට පැමිණියේ අවාසනාවට වගේ පැ සතරකට පසුවය.

ආචාර්ය ආනන්ද ගුරුගේ, වෛද්‍යාචාර්ය ඒ.ඩී.පී. විජයගුණවර්ධන, සී.ඩී.එ. ගුණවර්ධන, ජී.ජේ. කුමාරගේ, හේමචන්ද්‍ර, ඩබ්ලිව්. ගුණසේකර, ඒ.ඩබ්ලිව්. කලුආරච්චි, ඇල්බට් එදිරිසිංහ, ගාමිණී ජයසූරිය, ඊ.එච්. දිසානායක, පෙමසිරි අභය වික්‍රම, හේම එල්ලාවල, ජිනදාස පෙරේරා, ප්‍රේමරත්න අබේසේකර ආදී හිතවත් දායකවරු මහත් කම්පාවකින් යුක්ත ව එහා මෙහා යමින් අවශ්‍ය දේ කළහ. විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු, කථිකාචාර්යවරු හා කාර්යාලීය නිලධාරීන් ඇතුළු සේවකයෝ ද දුක්මුසු මුහුණින් යුතු ව සිටියහ. විද්‍යොදය පරිවෙණාධිපති නායක ස්වාමීන්ද්‍රයෝ, ප්‍රමුඛාචාර්ය පරවාහැර වජිරඥාන නායක ස්වාමීන්ද්‍රයෝ, ප්‍රමුඛාචාර්ය පලන්නොරුවේ විමලධම්ම නායක ස්වාමීන්ද්‍රයෝ, පුස්තකාලයාධිපති වේරගොඩ අමරමෝලි නා හිමියෝ, පනන්ගල ජිනරතන නා හිමියෝ, ගනේගම ඉන්දසාර නා හිමියෝ, අකුරටියේ අමරවංශ නා හිමියෝ, අම්බලන්ගොඩ ධම්මකුසල නා හිමියෝ, හානුදූ පැල්පොල පුඤ්ඤරතන නා හිමියෝ ආදී හිතවත් නා හිමිවරු දින ගණනක් ම රෑ දවල් දෙක් හි වැඩි වේලාවක් ම ආරෝග්‍ය ශාලාවේ නතරව සිටිය හ. නායක හිමියන්ගේ අතවැසි ශිෂ්‍ය පිරිස පිරිත් කියමින් ඇඳ වටා රැස්ව සිටියහ.

## අපවත්වීම

17 වැනි දින දවල් 2.25 ට පමණ භක්තිමත් ශිෂ්‍යවරුන්, අතවැස්සන්, ඥාතීන්, මිත්‍රයන්, දායකයන් පමණක් නොව මුළු මහත් ආරෝග්‍ය ශාලාව ම ශෝකයෙන් හඬා වැලපෙද්දී සදානුස්මරණීය අපේ නායක මා හිමියන් වහන්සේ අන්තිම හුස්ම හෙලූ සේක.

නායක මා හිමියන් විසූ වාට්ටුව භාර නේවාසික තරුණ වෛද්‍යවරයෙක් වූ ජේ.බී. පීරිස් මහතා ගත් ප්‍රශංසනීය, අප්‍රතිහත ධෛර්‍යය නිසා නායක මා හිමියන් ගේ වටිනා ජීවිතය පැය කීපයක් කල් වැඩියෙන් රඳවා ගත හැකිවීම ගැන මෙහි සඳහන් නොකර ම නොහැකි ය.

## මාහිමියන්ගේ ශිෂ්‍යවරු

සෝරත නායක මා හිමිපානන්ගෙන් ධර්මවිනය හා භාෂා ශාස්ත්‍ර ඉගෙනගත් ගිහි පැවිදි ශිෂ්‍යවරුන්ගේ ගණන මෙතෙකැයි කිය නොහැකිය. උන්වහන්සේ නමින් මහණ උපසම්පදාව ලැබූ ශිෂ්‍යවරු කීපදෙනෙක් සිටිති. මොවුන් අතර උන්වහන්සේගේ ඥාති සහෝදරයෙක් වූද, හික්කඩුවේ තිලකාරාමය හා නලාගස්දෙනියේ ශ්‍රී නාගාරාමය යන විහාරද්වයයේ අධිපති වූද වැලිවිටියේ තපස්සී ස්වාමීන්ද්‍රයෝ ප්‍රධාන ශිෂ්‍යවරයාය. මුන්වහන්සේ ද භික්ෂූන් අතර ජනප්‍රිය ක්‍රියාශූර නිර්භීත යතිවරයෙකි. විල්පිට ඤාණිස්සර, හික්කඩුවේ රේවත, හික්කඩුවේ උදිත, යන මේ තුන්නමද උන්වහන්සේගේ මහණ උපසම්පදා ශිෂ්‍යයෝය. දිගම්පතහෙ ප්‍රෙමරතන නම නායක මාහිමියන්ගේ අන්තේවාසික සාමණේර නමකි. පණ්ඩිත ගලගම සරණංකර ස්ථවිරයන් වහන්සේ කුඩාකල සිට නාහිමියන්ගේ පා සෙවෙනෙහි උන්වහන්සේගේ දුක සැප දෙක්හි එක සේ සොයා බැලූ, උන්වහන්සේගෙන් ධර්මශාස්ත්‍රය උගත් ශිෂ්‍යවරයෙකි. නාහිමියන්ගේ නියමය පිට නලාගස්දෙනියේ ශ්‍රී නාගාරාමයෙහි කටයුතු සොයාබලගන්නේ දෙනිපිටියේ ධම්මාරාම මාහිමියන් හා අගලියේ චන්ද්‍රජෝති හිමියනුත් විසිනි. කහවේ දේවරක්ඛිත, අකුරටියේ සංකිච්ච කඩිහිංගල සොරත යන භික්ෂුවරු නාහිමියන් ට ඉතා භක්තියෙන් සේවය කළ අන්තේවාසිකයෝයි.

ගිහි ශිෂ්‍යයන් අතර වෛද්‍යකලානිධි ප්‍රේමසිරි අබේවික්‍රම වෙදමහතා නාහිමියන්ගේ ප්‍රසාදය දිනාගත් ශිෂ්‍යවරයෙකි.

ඤාතීන් අතර සී.ඩී.ඒ. ගුණවර්ධන මහතා හා මැතිනිය නාහිමියන් බේරා ගැනීම සඳහා නොගත් උත්සාහයක්, නොදුරු වියදමක් නැතැයි කිය යුතුය.

## නාහිමියන්ගේ දර්ශනය (Philosophy)

සොරත නායක මාහිමියන්ගේ දර්ශනය (Philosophy) සම්පූර්ණයෙන්ම ගොඩ නැගී ඇත්තේ "උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය" යන බුදු වදන මතය. උන්වහන්සේගේ අදහසේ හැටියට "ජීවිතය" යනු ක්‍රියාකාරී බලවේගයකි. ඒ බලවේගය නිසි අයුරින් පාවිච්චි නොකොට කුසීතයන් වී සිටින්නන් දෙස උන්

වහන්සේ බැලුයේ බලවත් අප්‍රසාදයෙනි. ජීවිතය-නිසරු-ඉවත දැමිය යුතු-දෙයකැයි යන මතය උන්වහන්සේ නොපිළිගත් අතර එය ප්‍රයොජනය ගතයුතු-වැඩෙහි යෙදිය යුතු වටිනා මෙවළමක් ආයුධයක් ලෙස උන්වහන්සේ සැළකුහ. බෞද්ධයන්ගේ පරමාර්ථයවූ නිවන පවා ලබාගත හැක්කේ මේ ජීවිතය නැමති මෙවළම නිසි අන්දමින් පාවිච්චි කිරීමෙන් බව උන්වහන්සේ විශ්වාස කළහ. හාල් සේරු දෙක පවා කපා දමන්නට යයි වරක් උන්වහන්සේ ප්‍රසිද්ධ සභාවක නිර්භීතව ප්‍රකාශ කළේ ජීවිතය නැමති ක්‍රියාකාරී බලවේගය නිසි අයුරින් පාවිච්චි කිරීම මිනිසත් බවේ පරම යුතුකම බව උන්වහන්සේ තදින් විශ්වාසකර තිබුනු නිසාය.

පාරම්පරික වශයෙන් එන ඇතැම් අහිතකර සිරිත් විරිත් හා සිතුම් පැතුම් නැමති මහගල් පවුරට මැදිවී ඇති භික්ෂු ජීවිතය එයින් මුදවා ඉදිරියට ගමන් කරවීම සඳහා උන්වහන්සේ ගත් මහා ප්‍රයත්නයේ ප්‍රතිඵලයකි විද්‍යොදය විශ්ව විද්‍යාලය.

**රට දැය සමය වෙනුවෙන් මුලු ජීවිතය ම කැප**

**කළ ශ්‍රෙෂ්ඨතම සංඝ පිතෘවරයන් වහන්සේ වූ**

**අතිගරු වැලිවිටියේ ශ්‍රී සොරතාභිධාන නායක**

**මාහිමියන් වහන්සේට නිවන් සැප ලැබේවා.**